රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2025-03-10 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. බස්රථවල නිර්මාණය (Design) වෙනස් කිරීම සහ විකරණය (Modification) සම්බන්ධව නෛතික තත්ත්වය

මෝටර් රථ පනතේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුගතව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය සහිතව වාහනවල නිර්මාණය (Design) වෙනස් කිරීම සහ වාහන විකරණය (Modification) කිරීම සිදු කළ හැකිය. ඒ අනුව, 1983 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද මෝටර් වාහන (තැනීම්) නියෝග වරින්වර සංශෝධනය කරමින්, වාහන විකරණය කළ හැකි ආකාරය සම්බන්ධයෙන් රෙගුලාසි ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කර තිබේ. එහෙත්, පසුගිය කාලයේදී එවැනි නියෝග මඟින් ප්‍රකාශිත වාහන උපාංග සවි කිරීම් සහ නිර්මාණය වෙනස් කිරීම්වලට අමතරව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ක්‍රමවේද ඔස්සේ බස්රථ සැරසිලි සහ උපාංග විකරණය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර අභ්‍යන්තර චක්‍රලේඛයක් ද නිකුත් කරනු ලැබ ඇත. එහෙත්, ඊට අදාළව මෝටර් රථ පනතේ විධිවිධාන පරිදි අදාළ නියෝග ප්‍රකාශයට පත් කිරීමක් සිදු කර නොමැත. එබැවින්, මෙම සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, බස්රථ සැරසිලි හා උපාංග හේතුවෙන් බස්රථවල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාවට ඇති විය හැකි බලපෑම පිළිබඳ අධ්‍යයනය කර, ඒ සම්බන්ධයෙන් විධිමත් පරිදි ක්‍රියාකිරීම සඳහා නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් අදාළ සියලු ආයතන නියෝජනය වන පරිදි නිලධාරි කමිටුවක් පත් කිරීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

### 02. ගාල්ල නව අධිකරණ සංකීර්ණයට යාබදව අත් කර ගත් ඉඩමේ නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම

අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා අත් කරගනු ලැබ ඇති, ගාල්ල නව අධිකරණ සංකීර්ණයට යාබද ඉඩමේ පර්චස් 130ක බිම් ප්‍රමාණයක ගාල්ල නීතිඥ සංගමයේ වියදමින් නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධයෙන් වන යෝජනාව 2025-02-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදී. එහිදී එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවතින නීතිමය සහ අනෙකුත් කරුණු පිළිබඳව අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් අදාළ ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත නිලධාරි කමිටුවක් පත් කරනු ලැබ ඇත. එම නිලධාරි කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත පදනම්ව, පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ ගාල්ල නීතිඥ සංගමය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ඉඩමේ අයිතිය රජය සතුව පැවතියදී ඉහත සඳහන් පර්චස් 130ක ඉඩම් කොටස තුළ ගාල්ල නීතිඥ සංගමයේ අරමුදල් මඟින් නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම.

* එම සංගමය විසින් ගොඩනැගිල්ල ඉදිකිරීම පිණිස ආයෝජනය කරනු ලබන මුළු මුදල බදු කුලී මුදලින් ආවරණය වන පරිදි වසර 30ක කාලයකට එකී ගොඩනැගිල්ල නඩත්තු කරමින් භාවිත කිරීම සඳහා එහි භුක්තිය ගාල්ල නීතිඥ සංගමය වෙත ලබා දීම.

* නීතිඥ වෘත්තියට අදාළව මහජනතාව වෙත සේවාවන් ලබා දීම හැර එම ගොඩනැගිල්ල කිසිදු ආකාරයේ වාණිජ කටයුත්තක් සඳහා යොදා නොගැනීම.

* වසර 30ක කාලයකින් පසුව ගොඩනැගිල්ලේ භුක්තිය අධිකරණ විෂය භාර අමාත්‍යාංශය වෙත භාර දීම.

* ඉන් අනතුරුව, තවදුරටත් අවශ්‍ය වන්නේ නම් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගාල්ල නීතිඥ සංගමය සමඟ නව අවබෝධතා ගිවිසුමකට එළඹීම මඟින් බදු පදනම මත එකී ගොඩනැගිල්ල භාවිත කිරීම පිණිස ඉඩ සලසා දීම.

**03. ජාත්‍යන්තර සූර්ය බල සන්ධානය (ISA) වෙත වාර්ෂික දායකත්ව ගාස්තු ගෙවීම සහ ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර සූර්යබල සන්ධානය අතර රටවල් පිළිබඳ හවුල්කාරිත්ව කාර්යරාමුවට (CPF) අත්සන් තැබීම**

සූර්ය බලශක්තිය භාවිතය ප්‍රවර්ධනය කිරීමට සාමාජික රටවල් ගෙන ඇති පියවර සඳහා සහාය වීමේ අරමුණින් ජාත්‍යන්තර සූර්යබල සන්ධානය පිහිටුවා තිබේ. මේ වන විට ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 75ක් එහි සාමාජිකත්වය ලබා ඇති අතර රටවල් 54ක් හවුල්කාරිත්ව කාර්යරාමු ගිවිසුම අපරානුමත කර ඇත. ශ්‍රී ලංකාව අයත් වන

SRI LANKA MIRROR

කාණ්ඩය අනුව ස්වේච්ඡා දායකත්ව ගාස්තුව වශයෙන් වාර්ෂිකව ඇමෙරිකානු ඩොලර් 25,000ක දායකත්ව ගාස්තුවක් ගෙවිය යුතු වේ. සූර්ය බලශක්ති ක්ෂේත්‍රයට අදාළව සූර්ය තාක්ෂණ යෙදවුම් සම්පත් මධ්‍යස්ථාන (STAR-C) හරහා ධාරිතා වර්ධනය, ප්‍රතිපත්ති සංවර්ධනය, අරමුදල් සඳහා ප්‍රවේශය, ගෝලීය ජාලකරණය, දැනුම හුවමාරු කර ගැනීම ආදී ප්‍රතිලාභ ජාත්‍යන්තර සූර්යබල සන්ධානය වෙතින් අත් කර ගැනීමට එහි සාමාජික රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාවට හැකියාව පවතී. ඒ අනුව, බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ පහත සඳහන් යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* 2024/25 මූල්‍ය වර්ෂයේ සිට ඇමෙරිකානු ඩොලර් 25,000ක් වූ වාර්ෂික දායකත්ව මුදල් අඛණ්ඩව ගෙවීම.
* ශ්‍රී ලංකාවේ තාක්ෂණ යෙදවුම් සම්පත් මධ්‍යස්ථානයක් (STAR-C) පිහිටුවීම.
* 'රටවල් පිළිබඳ හවුල්කාරිත්ව කාර්යරාමුව' ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර සූර්යබල සන්ධානය අතර අත්සන් තැබීම.

SRI LANKA MIRROR

## 04. 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම

කර්මාන්ත අංශයේ තාක්ෂණික, වෙළෙඳ, නිපුණතා හා පාරිසරික ආදී ක්ෂේත්‍රයන්ට අදාළ කාලීන අවශ්‍යතාවන් සපුරාගත හැකි වන පරිදි කර්මාන්ත ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා දැනට පවතින 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව පෙනී ගොස් ඇත. එබැවින්, එකී පනත සංශෝධනය කිරීම සඳහා 2021-03-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. නීති කෙටුම්පත් සම්පාදක විසින් මේ වන විට එකී පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, පනත සංශෝධනය කිරීමේ කාර්යය සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලබා ගැනීමේ අවශ්‍යතාව නීති කෙටුම්පත් සම්පාදක විසින් පෙන්වා දී ඇත. ඒ අනුව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

**05. 1957 අංක 51 දරන තේ පාලන පනත සංශෝධනය කිරීම**

1957 අංක 51 දරන තේ පාලන පනතට පහත සඳහන් කරුණු ඇතුළත් කරමින් සංශෝධනය කිරීම සඳහා 2021-01-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත:

* තේ කර්මාන්තශාලාවල නිෂ්පාදන කාර්යයේදී වර්ග කිරීමෙන් අනතුරුව බැහැර කරනු ලබන තේ සඳහා "ප්‍රතිසැකසුම් තේ" (Reclaimable Tea) ලෙස නිර්වචනයක් හඳුන්වා දීම.
* ප්‍රතිසැකසුම් තේවලින් තවදුරටත් නිමි තේ නිස්සාරණය කළ පසු ඉතිරි වන කොටස "ප්‍රතික්ෂේපිත තේ" (Refuse Tea) ලෙස නම් කිරීම.
* තේ සැකසුම්කරුවන් (Tea Processors) ලියාපදිංචි කිරීම, ඔවුන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ පරිපාලනය කිරීම ඇතුළු ඔවුන්ට බලපාන අනෙකුත් නෛතික ප්‍රතිපාදන ඇතුළත් කිරීම.

නීති කෙටුම්පත් සම්පාදක විසින් මේ වන විට එකී පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, ඒ සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලබා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත. ඒ අනුව, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලදී.

**06. රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කරමින් අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාලරාමු හඳුනාගෙන ඒ ආශ්‍රිතව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු බඳවාගැනීම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස 2024-12-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම කමිටුව වෙත ඒ ඒ අමාත්‍යාංශ විසින් එම අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතනවල පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන, කමිටුව විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් බඳවාගැනීම් සිදු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ සහ ආයතන වෙත අනුමැතිය ලබා දීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

| අනු අංකය | අමාත්‍යාංශ/පළාත් සභා | බඳවාගැනීම සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලද තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 909 |
| 2. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | 109 |
| 3. | පරිසර අමාත්‍යාංශය | 144 |
| 4. | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 2,500 |
| 5. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 22 |
| 6. | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 3 |
| 7. | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 185 |
| 8. | ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය | 20 |
| 9. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 1,615 |
| 10. | මධ්‍යම පළාත් සභාව | 72 |
| 11. | ඌව පළාත් සභාව | 303 |
| | මුළු සංඛ්‍යාව | 5,882 |

SRI LANKA MIRROR RIGHT TO KNOW. POWER TO CHANGE

## 07. කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීම

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති ලෙස කටයුතු කළ ජේ.එම්.ආර්.පී.ජයසිංහ මහතා 2025-02-01 දින සිට උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් තනතුරට පත් කර ඇති බැවින්, මේ වන විට කෑගල්ල දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුර පුරප්පාඩු වී තිබේ. එකී තනතුර සඳහා දැනට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරක සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එච්.එම්.ජේ.එම්.හේරත් මහතා පත් කිරීම යුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, කෑගල්ල දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එච්.එම්.ජේ.එම්.හේරත් මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීම

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන් කටයුතු කළ ආර්.එම්.ආර්.රත්නායක මහතා 2025-03-03 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති බැවින්, එම තනතුර පුරප්පාඩු වී තිබේ. එම තනතුරට සුදුසු නිලධාරියෙකු වශයෙන් දැනට වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ඩී.එම්.කේ.සී.දිසානායක මහතා හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ඩී.එම්.කේ.සී.දිසානායක මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන් පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*****************

SRI LANKA MIRROR
RIGHT TO KNOW. POWER TO CHANGE